# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක: 16/2018

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2018 දෙසැම්බර් මස 26 දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයින් මාරු කිරීම**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 78 වගන්තිය කෙරෙහි සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහයේ IV පරිච්ඡේදයේ I වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

අන්තර් විශ්වවිද්‍යාල මාරුවීම් අපේක්ෂා කරමින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද සේවා නියුක්තිකයන්ගේ ස්ථාන මාරු අයදුම්පත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබීමේ අනුපිළිවෙල අනුව අදාළ උසස් අධ්‍යාපන ආයතන / ආයතන වෙත යොමු කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2018.09.20 දින පැවති සිය 995වන සභා වාරයේ දී තීරණය කරන ලදී.

තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ස්ථාන මාරුවීම් ලබාගෙන අදාළ උසස් අධ්‍යාපන ආයතනවල / ආයතනවල රාජකාරි භාරගත් සේවකයින්ගේ ස්ථාන මාරුවීම් අයදුම්පත්, ඔවුන් ස්ථාන මාරු ලැබූ උසස් අධ්‍යාපන ආයතන / ආයතනවල අවම වශයෙන් වසරක කාලයක් සේවය කරන තුරු ඔවුන් මීට පෙර අනුයුක්තව සිටි උසස් අධ්‍යාපන ආයතන / ආයතන සඳහා සලකා නොබලන බව ද තීරණය විය.

තවද, වෙනත් ක්‍රම මගින් පවත්නා පුරප්පාඩු පිරවීමට පියවර ගැනීමට පෙර, අන්තර් විශ්වවිද්‍යාල මාරුවීම් අපේක්ෂා කරන සේවකයින්ට ප්‍රමුඛතාවය ලබා දීමට උසස් අධ්‍යාපන ආයතන / ආයතන පියවර ගත යුතු බවට 2012.01.04 දිනැති කොමිෂන් චක්‍රලේඛ අංක 974 හි දක්වා ඇති උපදෙස් කෙරෙහි ඔබේ අවධානය යොමු කෙරේ..

ඒ අනුව, ආයතන චක්‍රලේඛ ලිපි අංක 02/2018 අවලංගු කරන අතර මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2019.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අත්. කළේ / මහාචාර්ය මොහාන් ද සිල්වා**
සභාපති

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරි / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්

12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. ප්‍රධාන අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

යූජීසී/එච්ආර්/5/1